**වී අලෙවි මණ්ඩලය - 2017**
**-------------------------------**

වී අලෙවි මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------------**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**
**---------------------------------**

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කර විගණනය කර තිබූ 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | වටිනාකම |
|---|---|
| | ------------ |
| | රු. |
| **වත්කම්** | |
| --------- | |
| ජංගම නොවන වත්කම් | 1,253,094,741 |
| ජංගම වත්කම් | 12,155,177,280 |
| | ----------------- |
| මුළු වත්කම් | 13,408,272,021 |
| | ============ |
| **බැරකම්** | |
| ---------- | |
| ජංගම බැරකම් | 10,196,560,953 |
| ජංගම නොවන බැරකම් | 15,272,288,892 |
| | -------------------- |
| | 25,468,849,845 |
| ශුද්ධ වත්කම්/අයිතිය | (12,060,577,824) |
| | ============ |
| මුළු බැරකම් | 13,408,272,021 |
| | =========== |
| මුළු ආදායම | 9,289,377,234 |
| මුළු වියදම | 15,183,703,089 |
| | ---------------- |
| ඌනතාවය | 5,894,325,855 |
| | =========== |

**2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

මණ්ඩලයේ පොත්පත් අනුව ලංකා බැංකුව වෙත ගෙවිය යුතු ණය ශේෂය රු.මිලියන 8,585.9 ක් වුවද ලංකා බැංකුවේ ශේෂ සනාථන අනුව එම ශේෂය රු.මිලියන 8,589.02 ක් වූයෙන් රු. මිලියන 3.12 ක වෙනසක් පැවතුනි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2016 ජනවාරි 28 දිනැති අංක එම්ආර්ඊඒ/සීඑම්/2016/7 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබී තිබූ 2016 පෙබරවාරි 24 දිනැති අංක අමප/16/0185/732/006 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ ඉදිකල මෙට්‍රික්ටොන් 2,000 ක් හා මෙට්‍රික්ටොන් 10,000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා 2 ක් මණ්ඩලය වෙත 2016 වර්ෂයේදී පවරාගෙන තිබුණි. මෙම ගබඩා ඉදිකිරීම වෙනුවෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතුව තිබුණු රු.34,451,514 ක් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2017 අගෝස්තු 17 හා 2017 ඔක්තෝබර් 16 දිනවලදී

මණ්ඩලය විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ගබඩා සංකීර්ණ පිහිටි ඉඩම නිවාස සංවර්ධන අධිකාරියට අයත්ව පැවති අතර 2018 අගෝස්තු 15 දින වන විටත් මණ්ඩලය වෙත පවරාගෙන නොතිබූ අතර ගබඩා පවරාගත් දින සිට විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 26 දින දක්වාම ගබඩා කර තිබුණේ මෙට්‍රික්ටොන් 25.5 ක් වූ අබලි වී තොගයක් හා මෙට්‍රික් ටොන් 7.81 ක් වූ වී තොගයක් පමණක් වූයෙන් මෙම ගබඩා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) මණ්ඩලය විසින් රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ අලාභ පියවා ගැනීම මැයෙන් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යවරයා විසින් 2016 නොවැම්බර් 25 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2016 දෙසැම්බර් 21 දිනැති අංක අමප/16/2541/732/037 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මණ්ඩලයේ ගිණුම් යාවත්කාලීන කර, බාහිර ස්වාධීන විගණකයකු මගින් මූල්‍ය විගණනයන් හා තොග සත්‍යාපනයක් සිදු කළ යුතු බවට යෝජනා කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් 2017 ජූනි 12 දින සිට එක් එක් කලාපවලට අයත් ගබඩාවල වී තොග සත්‍යාපන වැඩසටහන් ආරම්භ කර තිබුණද 2018 ජූනි 30 දින වන විටත් අම්පාර, පොළොන්නරුව හා නැගෙනහිර කලාපවලට අයත් තොග සත්‍යාපන කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ පීඊ/111/සීඑම්/2013 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා ඉදිරිපත් කළ නිරීක්ෂණ වලට අනුව මනා වී තොග පාලන පද්ධතියක් පවත්වාගෙන නොයෑම හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය පිරිවැය ඉහළ යන බව දක්වා තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් 2013 වර්ෂයේ තොග පාලන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත භාර දී තිබුණි. ඒ සඳහා 2013 වර්ෂයේ සිට 2016 ජූනි 30 දින දක්වා මණ්ඩලය විසින් රු.13,035,405 ක් වැය කර තිබුණද 2018 ජූලි 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2016 ඔක්තෝබර් 26 දිනැති අංක අමප/16/2068/723/053 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මණ්ඩලය සතු වී තොග සාධාරණ මිලක් යටතේ සමුපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී එම වී සහල් බවට පත්කර ලංකා සතොස, සමුපකාර හා තොග වෙළඳුන් හරහා පාරිභෝගිකයින්ට ලබා දීමටත්, සහල් අලෙවියෙන් පසු ලැබෙන මුදලින් මණ්ඩලයේ මිල ගණන් පියවීමටත් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත වී කිලෝග්‍රෑම් 95,935,082 ක් නිකුත් කර තිබුණු අතර ඉන් ණය පදනම මත ලබා දී තිබුණු වී කිලෝග්‍රෑම් 39,179,868 ක් සම්බන්ධයෙන් මණ්ඩලය හා සංස්ථාව අතර ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. මණ්ඩලය විසින් නිකුත් කර තිබුණු වී සඳහා සංස්ථාවෙන් ලැබී තිබුණේ රු.1,972,629,100 ක් පමණක් බැවින් 2017 නොවැම්බර් 16 දිනට තවදුරටත් අයවීමට පැවති ශේෂය රු.2,343,579,014 ක් විය.

## 3.3 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය සිදු කළ තොග සත්‍යාපනයේදී තොග ලේඛණ හා භෞතික සත්‍යාපන තොග ශේෂය අනුව වී කිලෝග්‍රෑම් 13,379,128 ක ඌනතාවයක් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) වී තොග නිසිලෙස බිම් රාක්කවල අසුරා නොතිබීම, ගබඩාවලට උල්දිය දැමීම, වැසි ජලය ගබඩාවලට කාන්දු වීම, කෘමි සතුන්ගෙන් සිදුවන හානි හා නිසි කලට වී තොග නිකුත් නොකිරීම නිසා වී තොග කිලෝග්‍රෑම් 192,453 ක් හානි වී තිබුණු බව වී තොග සත්‍යාපනයේදී නිරීක්ෂණය විය.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව වී අලෙවි මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදනයන්

මණ්ඩලය විසින් සිදු කර තිබූ බිම් රාක්ක මිලදීගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම් පළකර තිබූ අතර බිම් රාක්කයක තිබිය යුතු පිරිවිතරයන්හි බිම් රාක්කයක පැවතිය යුතු තෙතමනය සියයට 20 ක් ලෙස සඳහන්ව නොතිබීම නිසා සහ සැපයුම්කරුවන් ඉදිරිපත් කළ මිල ගණන්වල අඩුපාඩු පැවතීම හේතුවෙන් පළමු ප්‍රසම්පාදන දැන්වීමට අදාලව සමාගම් 3 කින් ලැබී තිබූ මිල ගණන් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව, නැවත දැන්වීම පළකිරීම වෙනුවෙන් රු.45,080 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. තවද, නව ප්‍රසම්පදාන කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරුට වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතු බව දක්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.51,300,000 ක් වැයකර බිම් රාක්ක 10,000 ක් වසර 5 ක පළපුරුද්දක් නොමැති සැපයුම්කරුවෙකුගෙන් මිලදීගෙන තිබූ අතර ලැබී තිබූ බිම් රාක්ක 9130 කින් රාක්ක 5265 ක් නියමිත ප්‍රමිතියෙන් තොරව පැවතුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගබඩා පරිපාලනය | (i) නිසි ප්‍රමිතියකින් යුතුව වී තොග ගබඩා නොකිරීම.<br>(ii) ගබඩා වාර්තා / ලේඛණ යාවත්කාලීනව පවත්වා නොයෑම.<br>(iii) පරිගණකගත තොග පාලන පද්ධතියක් පවත්වා ගෙන නොයෑම. |
| (ආ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම | (i) බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම.<br>(ii) හඳුනා නොගත් ශේෂ නිරවුල් නොකිරීම. |